# <u>නව විදේශ ගමන් බලපත්‍රය සඳහා වන අයදුම්පත පිරවීමට උපදෙස්</u>

- ❖ අයදුම්පත **<u>ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්</u>** පුරවන්න.
- ❖ නම/ලිපිනය ලිවීමේදී **<u>වචන දෙකක් අතර කොටුවක් ඉඩ තබන්න</u>**.
- ❖ ඔබගේ වාසගම වෙනමත් ඉතිරි නම් වෙනමත් ලිවිය යුතු බව සලකන්න. දැනට තිබෙන ගමන් බලපත්‍රයේ සඳහන් ආකාරයටම **<u>වෙන වෙනම</u>** ලිවීම අනිවාර්ය වේ.
- ❖ අකුරු පැහැදිලිව ලියන්න. අපැහැදිලි අකුරු නිසා නව විදේශ ගමන් බලපත්‍රයේ ඔබගේ නම වැරදි ලෙස සඳහන් වීමට ඉඩ ඇත.
- ❖ **<u>ඡායාරූප අයදුම්පතෙහි නො අලවා</u>** බාරදෙන්න. ඔබගේ මුහුණේ දැනට තිබෙන ස්වරූපයට සමාන නැතිනම් එම ඡායාරූප භාරගනු නොලැබේ.
- ❖ ලිවීමේදී යම් වැරදීමක් සිදුවුවහොත් එය නිවැරදි කිරීම සඳහා මකන දියර භාවිතා නොකරන්න. තනි ඉරකින් වැරදුන වචනය/ඉලක්කම කපා දමා නැවත ලියන්න. නැවත ලිවීමට පෙර කාර්ය මණ්ඩලයෙන් ද උපදෙස් ලබා ගත හැකිය.

1. All Countries ඉදිරියෙන් (√) ලකුණ යොදන්න.
2. දැනට තිබෙන විදේශ ගමන් බලපත්‍රයේ අංකය කොටු තුළ ලියන්න.
3. අදාළ නොවේ.
4. ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පතෙහි අංකය කොටු තුළ ලියන්න.
5. **<u>වාසගම පමණක්</u>** ලියන්න. (මෙය දැනට තිබෙන විදේශ ගමන් බලපත්‍රයේ දැක්වෙන ආකාරයට පමණක් ලිවිය යුතුය.)
6. **<u>අනෙකුත් නම් පමණක්</u>** මෙහි ලිවිය යුතුය. මෙහි **<u>වාසගම නැවත නොලිය යුතුය.</u>**
7. කොරියාවේ ඔබ දැනට පදිංචි ස්ථානයේ ලිපිනය කොටු තුළ ලියන්න.
8. උපන් දිනය (දිනය,මාසය සහ අවුරුද්ද ) කොටු තුළ අදාළ පරිදි ලියන්න.
9. උප්පැන්න සහතිකයේ අංකය *ඔබ උපන් ස්ථානයට අදාළ දිස්ත්‍රික්කය කොටු තුළ ලියන්න.
10. උපන් ස්ථානය (මෙය දැනට ඔබ සතුව ඇති විදේශ ගමන් බලපත්‍රයේ දැක්වෙන ආකාරයට **<u>පමණක්</u>** ලිවිය යුතුය)
11. ස්ත්‍රී /පුරුෂ භාවය (අදාළ කොටුව තුළ (√) යොදන්න.)
12. **මෙහි කිසිවක් නොලියන්න.**
13. ඔබ කොරියාව හෝ වෙනත් රටක **පුරවැසිභාවය** (Citizenship) ලබාගෙන තිබේද? එසේ නොමැතිනම් "No" ඉදිරියෙන් ඇති කොටුව තුළ (√) යොදන්න. (අයදුම්පතෙහි අංක 16 සහ 17 ඔබට අදාළ නොවේ.)
    - **<u>එසේ ලබාගෙන තිබේ නම්</u>** "Yes" ඉදිරියෙන් ඇති කොටුව තුළ (√) යොදා එම අංකය දක්වා ඇති කොටු පෙළෙහි ලිවිය යුතු අතර අයදුම්පතෙහි අංක 16 සහ 17 ද පිරවිය යුතුය.
14. කොරියාවේ දී ඔබ භාවිතා කරන ජංගම දුරකථන අංකය සඳහන් කරන්න.
15. ඊමේල් ලිපිනය

-ඊළඟ පිටුව බලන්න-

# 2,3 පිටු

**16-17** පිරවිය යුත්තේ ද්විත්ව පුරවැසිභාවය ලබා ඇති අය පමණි.

| |
|---|
| 18. නව විදේශ ගමන් බලපත්‍රයක් අවශ්‍ය වන්නේ වයස අවුරුදු 16ට අඩු දරුවෙකුට නම්, කොටු තුළ මවගේ සහ පියාගේ ශ්‍රී ලංකා ජාතික හැඳුනුම්පත් අංක හෝ විදේශ ගමන් බලපත්‍ර අංක සඳහන් කළ යුතුය. |

- ඡායාරූප ඇලවීමෙන් වළකින්න. **මාස තුනක් ඇතුළත ලබාගන්නා ලද සෙ.මී. 3.5 x සෙ.මී. 4.5 ප්‍රමාණයෙන් යුතු ඡායාරූප තුනක් (03)** පමණක් කවරයක බහා අයදුම්පත සමඟ භාර දෙන්න.

- **පිරිමි අයෙක් නම්,** කරාබු පැළඳි ඡායාරූප භාරගනු නොලැබේ. නිසි ප්‍රමිතියට නොමැති අඩුපාඩු සහිත ඡායාරූප ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇතිබව කාරුණිකව සලකන්න. එසේ වුවහොත් ගමන් බලපත්‍රය නිකුත්කිරීම ප්‍රමාද වනු ඇත.

19. හිස් කොටු දෙක තුළ ඔබගේ අත්සන **කළු ඉරිවල නොගෑවෙන පරිදි** තබන්න. **අත්සන දැනට ඔබ සතු විදේශ ගමන් බලපත්‍රයේ දැක්වෙන පරිදිම විය යුතුය.**

20. "**අයදුම්කරුගේ ප්‍රකාශය**" හොඳින් කියවා බලා පහත පරිදි හිස්තැන් **සිංහලෙන්** සම්පූර්ණ කරන්න.

20 (1) - **ද්විත්ව පුරවැසිභාවය ලබා ඇත්නම් පමණක්** රටේ නම හිස්තැන තුළ ලියන්න.
20 (2) - දැනට ඔබ සතු විදේශ ගමන් බලපත්‍රයේ අංකය හිස්තැන තුළ ලියන්න.
20 (3) - "දකුණු කොරියාවෙ" යන්න හිස්තැන තුළ ලිවිය යුතුය.
20 (4) – "දකුණු කොරියාවෙහි" යන්න හිස්තැන තුළ ලිවිය යුතුය.
20 (5) - මුලකුරු සමඟ ඔබේ නම (**උදා : එන්. කේ. එස්. පෙරේරා**) හිස්තැන තුළ ලියන්න.

- **3 වැනි පිටුවේ** දිනය හා ස්ථානය යෙදීමට තබා ඇති හිස්තැනෙහි දිනය යොදා ඒ ඉදිරියෙන් **"ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, දකුණු කොරියාව"** ලෙස සඳහන් කරන්න. ඊට ඉදිරියෙන් ඇති හිස්තැනෙහි ඔබගේ අත්සන යොදන්න.

21. "අයදුම්කරු පිළිබඳ සහතිකය" ඔබට අදාළ නොවේ.

## 4 වැනි පිටුව ඔබට අදාළ නොවේ